සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

ගෘහ ආර්ථික විද්‍යාව II
மனைப் பொருளியல் II
Home Economics II

28 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**
* **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

1. (i) නිර්මාණකරණයේ මූලිකාංගයක් වන 'වයනය' හඳුන්වන්න.
   (ii) ශීතකරණය භාවිතයේ දී විදුලිය අරපිරිමැස්ම සඳහා අනුගමනය කළ යුතු කරුණු **දෙකක්** ලියන්න.
   (iii) ප්‍රෝටීන පරිපූරණය හඳුන්වන්න.
   (iv) දුර්පෝෂණ තත්ත්ව නම් කරන්න.
   (v) මිනිසා විසින් නිෂ්පාදනය කරනු ලබන විශේෂිත කෙඳි වර්ග **දෙකක්** සඳහන් කරන්න.
   (vi) ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත **දෙකක්** ලියන්න.
   (vii) 'ප්‍රයාන සංවරණය' යනුවෙන් කුමක් අදහස් වන්නේ ද?
   (viii) 'හරිතාගාර ආවරණය' හඳුන්වන්න.
   (ix) ලිඛිත සන්නිවේදනයේ අවාසි **දෙකක්** ලියන්න.
   (x) පහළ (සෘණ) ස්වසංකල්පයකින් යුත් දරුවකු තුළින් දිස්වන ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.
   (ලකුණු 02 × 10 = 20 යි.)

2. (i) ප්‍රශස්ත ජීවන පරිසරය යනුවෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 03 යි.)
   (ii) මෝස්තර මූලධර්මයක් වන 'අවධාරණය' හඳුන්වන්න. (ලකුණු 03 යි.)
   (iii) අභ්‍යන්තර අවකාශ නිර්මාණයේ දී බිත්ති හා පොළොව නිර්මාණය සඳහා සැලකිලිමත් විය යුතු කරුණු **දෙක** බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)
   (iv) ගෘහීය විද්‍යුතය පරිභෝජනයේ දී අනුගමනය කළ යුතු ආරක්ෂක පූර්වෝපායන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)
   (මුළු ලකුණු 16 යි.)

3. (i) ජීර්ණය සඳහා වැදගත් වන මේද තෛලෝදකරණය හඳුන්වන්න. (ලකුණු 02 යි.)
   (ii) ආමාශයික ප්‍රදාහයෙන් පෙළෙන පුද්ගලයකු හට ලබාදිය යුතු පෝෂණමය උපදෙස් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)
   (iii) යකඩ ඌණතාවය ශ්‍රී ලංකාව තුළ බහුලව දැකිය හැකි පෝෂණ ගැටලුවකි. මෙම තත්ත්වය මඟහරවා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)
   (iv) හෘදයාබාධයෙන් පෙළෙන රෝගියකු සඳහා දිනක බොජුන්පතක් සැලසුම් කරන්න. (ලකුණු 06 යි.)
   (මුළු ලකුණු 16 යි.)

4. (i) 'ආහාර පරිරක්ෂණය කිරීම වැදගත් ය.' මීට හේතු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)
(ii) ආහාර ඇසුරුමක තිබිය යුතු ගුණාංග **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)
(iii) ආහාර බ්ලාන්ච් කිරීම (ප්‍රතිකාරණය) හඳුන්වා, එය සිදුකරන ආහාර **දෙකක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි.)
(iv) ආහාරයක ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා තාක්ෂණික ක්‍රම යොදාගන්නා ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)
(මුළු ලකුණු 16 යි.)

5. (i) මේස දරණුවක් මැසීමේ දී අනුගමනය කළ යුතු ප්‍රධාන කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)
(ii) නිමි ඇඳුම් සඳහා රෙදි තෝරා ගැනීමේ දී කරනු ලබන 'තන්තු පරීක්ෂාව' යනුවෙන් කුමක් අදහස් කරයි ද? (ලකුණු 03 යි.)
(iii) රෙදි 'පෙර පිරියම් කිරීමේ' ක්‍රියාවලිය විස්තර කරන්න. (ලකුණු 04 යි.)
(iv) වර්ණ දෙකක් යොදා ගනිමින් සිදුකරන බතික් මුද්‍රණය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)
(මුළු ලකුණු 16 යි.)

6. (i) හරිත පාරිභෝගිකයකු වශයෙන් ඔබගේ ගෙවත්ත සකසා ගැනීමේ දී අනුගමනය කළ යුතු පියවර **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)
(ii) කාබනික ගොවිතැනෙහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)
(iii) ස්වාභාවික හා මානව පාලිත යන සංචාරක ආකර්ෂණ හඳුන්වා ඒ එකිනෙකට උදාහරණ **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි.)
(iv) සංචාරණය මගින් ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)
(මුළු ලකුණු 16 යි.)

7. (i) 'ද්විතීයික ලිංගික ලක්ෂණ' යන්න හඳුන්වන්න. (ලකුණු 03 යි.)
(ii) 'ජීව විද්‍යාත්මක ක්‍රියාවලියේ වෙනස්කම් පුද්ගල පෞරුෂය කෙරෙහි බලපායි'. මෙම තත්ත්වය පිළිබිඹු කරන ලක්ෂණ **හතරක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි.)
(iii) නව යොවුන් දරුවන්ගේ පෞරුෂ වර්ධනය සඳහා සමාජයේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි.)
(iv) 'සමාජ මාධ්‍ය නව යෞවනයන් කෙරෙහි ධනාත්මක සහ සෘණාත්මක බලපෑම් ඇති කරයි'. මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි.)
(මුළු ලකුණු 16 යි.)

8. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) ගොඩනැගිලි නිර්මාණයේ දී සලකා බැලිය යුතු 'වටිනාකම් පද්ධතිය'
(ii) ආහාර පිසීමේ ක්‍රමයක් ලෙස 'බැදීම'
(iii) රෙදි මසර කිරීම
(iv) සංචාරක ව්‍යාපාරයේ ප්‍රගමනය සඳහා ගත හැකි පියවර
(v) නව යොවනයින් මුහුණ දෙන පවුල ආශ්‍රිත ගැටලු

(ලකුණු 04 × 4 = 16 යි.)

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI
Download past papers, notes, and more from Past Papers Wiki!